2022/23 සඳහා අයවැය කෙටුම්පත හා ප්‍රමුඛතාවන්

COVID තත්ත්වය හේතුවෙන් ඇති වූ හානියෙන් අත්මිදීමේ අභියෝගයන් සහ රජයේ වෙනත් මට්ටම්වලින් සැලකිය යුතු ලෙස දිගින් දිගටම පිරිවැය වෙනස් වීම මඟින් උද්ගත වන අභියෝගයන් හමුවේ වුව ද, නගරයේ ප්‍රජාවන් සම්බන්ධ කරන අතරේ නගරයේ අනාගතය කෙරෙහි ආයෝජනය කරන ආකාරය සැලසුම් කරන මූලික උපාය මාර්ගික ලේඛන කට්ටලයක කොටසක් ලෙස කේසි නගරයේ *2022/23 අයවැය කෙටුම්පත හා* 2022/23 වාර්ෂික ක්‍රියා සැලැස්ම එළි දක්වා තිබේ.

2022 අප්‍රේල් 19 වැනි අඟහරුවාදා දින එහි සභාවේ රැස්වීමේ දී සභාව විසින් උපාය මාර්ගික ලේඛන කෙටුම්පත් කට්ටලය මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම ලේඛනවලට අයත් වන්නේ:

- 2021-25 සභාවේ සැලසුම් කෙටුම්පත - අවුරුදු 2ක සමාලෝචනය
- වාර්ෂික ක්‍රියා සැලසුම් කෙටුම්පත 2022-23
- 2022-23 වාර්ෂික අයවැය, අවුරුදු 10ක මූල්‍ය සැලසුම සහ 2022-23 ප්‍රාග්ධන කාර්ය වැඩසටහන ඇතුළත් මූල්‍ය සැලසුම් කෙටුම්පත

2022/23 අයවැය කෙටුම්පත, ප්‍රාන්ත ආණ්ඩුවෙන් නියම කළ අපද්‍රව්‍ය හා පදික වේදිකා තීරු ප්‍රතිසංස්කරණ, සියයට 1.75ක අනුපාත සීමාව හා ඊට අමතරව COVID-19 මගින් ඇති වූ බාධක ඔස්සේ උද්ගත වූ ආර්ථික බලපෑම් සහ වෙනත් සාධක අතරේ, ඉස්මතු වූ මූල්‍ය බාධක හා අභියෝගවලට විසඳුම් සොයන අතරේ ප්‍රජාවේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ද තුලනය කරයි.

සම්පූර්ණ කෙටුම්පත් ලේඛන කට්ටලය 2022 මැයි 17 වැනි දා තෙක් උපදෙස් විමසීම් සඳහා විවෘත පවතින අතර ඉන්පසු, 2022 ජූනි 28 වැනි දින විශේෂ කවුන්සිල් රැස්වීමක දී ලේඛන නිල වශයෙන් පිළිගැනීමට පෙර කවුන්සිලය විසින් සියලු ප්‍රතිපෝෂණයන් සලකා බලනු ලබයි.

මේ පිළිබඳ ඔබගේ අදහස් ඉදිරිපත් කිරීම සඳහා, ඔබ සමීපයේ සිදු වන ප්‍රාග්ධන වැඩ ව්‍යාපෘති මොනවා දැයි සොයා බලා උපාය මාර්ගික ලේඛන කියවීම සඳහා අපේ මාර්ගගත බැඳීම් පෝටලය වන Casey Conversations වෙත පිවිසෙන්න.